

# ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විකාශනය වීම



## ඉතිහාසය

### 10 ශ්‍රේණිය - 03 වන පාඩම

සැකසුම : පී. පී. ආර්.පී.එස්.ගම්ලත්

කෑ/දෙහි/රංගල්ල මහා විද්‍යාලය

## නිපුණතාව

රටක දේශපාලන බලය විකාශනයට හේතු විමර්ශනය කරයි

## නිපුණතා මට්ටම

ශ්‍රී ලංකාවේ මුල්කාලීන සමාජය සමතුලිතව පවත්වාගෙන යාමට දේශපාලන බලය කේන්ද්‍රගත වූ ආකාරය විමසා බලයි

## ඉගෙනුම් ඵල

- රාජ්‍යත්වයේ පදනම විස්තර කරයි
- රාජ්‍යත්ව සංකල්ප, රාජ්‍ය උරුමය හා රජුගේ කාර්යභාරය විග්‍රහ කරයි
- ශ්‍රී ලංකාවේ මුල් යුගයේ පාලකයින් පිළිබඳ තොරතුරු විස්තර කරයි

# පටුන

3.1. පූර්ව රාජ්‍ය සමය

ඇගයීම

- ❖ පුරාණ ග්‍රාමීය සමාජ ව්‍යුහය
  - ගෘහපති
  - ගමික
    ඇගයීම
  - පරුමක
    ඇගයීම

- ❖ රාජ්‍යත්වයේ වර්ධනය
  - පණ්ඩුකාභය රජු
  - දේවානම්පියතිස්ස රජු
  - දුටුගැමුණු රජු
  - භාතිකාභය රජු
  - වසභ රජු
    ඇගයීම

3.2. රාජ්‍යත්ව සංකල්පය

- දේවත්ව සංකල්පය
- බෝධිසත්ව සංකල්පය
- පර්වතරාජ සංකල්පය
- චක්‍රවර්තී සංකල්පය
  ඇගයීම

- ❖ රාජ්‍ය උරුමය
- ❖ රාජ්‍ය තන්ත්‍රය

ඇගයීම

3.3. මෙරට පාලනය කළ ශ්‍රේෂ්ඨ රජවරු

- ❖ දුටුගැමුණු රජු
- ❖ වසභ රජු
- ❖ පළමුවන විජයබාහු රජු

ඇගයීම

## හැඳින්වීම


- සාහිත්‍ය මූලාශ්‍රගත කරුණු අනුව ක්‍රිස්තු පූර්ව 6 වන සියවසේ ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට පැමිණි **විජය කුමරු** මෙරට පාලනය කළ පළමු වන රජු ලෙස සලකනු ලබයි

- විජයාගමනයට පෙර එනම් ක්‍රි.පූ 2400 පමණ කාල පරිච්ඡේදයක සිට මෙරට කෘෂිකාර්මික සමාජ රටාවක් දියුණු වෙමින් පැවති බවට පුරාවිද්‍යාත්මක සාක්ෂි මගින් තහවුරුවී ඇත **නිදසුන් ; බෙරගල සහ හල්දුම්මුල්ල සොහොන්බිම ආශ්‍රිත කැණීම් තොරතුරු**

- එසේම මෙරට සමාජයේ දේශපාලන බලය එම රටේ ජනතාව විසින් රජුට හෝ රැජිනට පවරා දෙනු ලබයි

- මහජනතාවගේ වැඩි එකඟතාවයකින් පාලකයෙකු රට පාලනය කිරීමේ අයිතිය ලබා ගන්නා නිසා පාලකයෙකු හැඳින්වීමට ‘ **මහාසම්මත**’ යන වචනය පෙරදිග රටවල භාවිතා කර ඇත

**රාජ්‍යය යනු**



## 3.1 පූර්ව රාජ්‍ය සමය

- **රටක් පාලනය කිරීම සඳහා රජු හෝ රැජින, අමාත්‍යවරු, ප්‍රධාන නිලධාරීන් හා ජනතාව සම්බන්ධ වන යුගයට පෙර පැවති පාලන අවධිය පූර්ව රාජ්‍ය සමය ලෙස අර්ථ නිරූපණය කළ හැකිය.**

- මෙම අවධියෙහි රට පාලනය කිරීමට නිශ්චිත පාලකයෙකු නොවීය

- කුඩා ප්‍රදේශ වල වත්පොහොසත්කම් ඇති ප්‍රභූන් විසින් එක් එක් ප්‍රදේශ පාලනය කළ බව සෙල්ලිපි වල සදහන් වේ.

- **'පරුමක'** යනුවෙන් ඔවුන් සෙල්ලිපි වල හඳුන්වා ඇත.( ප්‍රමුඛ, ප්‍රධාන යන්න මෙහි අර්ථය වේ)

- ක්‍රි.පූ 250 ට අයත් මෙම සෙල්ලිපියෙහි ගල්ගුහාවක් භික්ෂුන් වෙත පූජා කළ පරුමකයෙකු **තොටබොජක** ලෙස හඳුන්වයි. (තීර්ථය අනුභව කරන්නා, තොටුපලෙන් අයබදු ලබා ගන්නා යන්න එහි අර්ථයයි)

## ඇගයීම

**පහත සඳහන් සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**


1. 'මහා සම්මත' යනුවෙන් හැඳින්වූයේ කවුරුන්ද?
2. විජය කුමරු පැමිණීමට පෙර මෙරට කෘෂිකාර්මික සමාජයේ දියුණුවක් පැවති බවට සාක්ෂි හමුවන ස්ථාන 2ක් නම් කරන්න
3. 'රාජ්‍යය' යනුවෙන් හඳුන්වනුයේ කුමක්ද?
4. පූර්ව රාජ්‍යය සමය යනු කුමක්ද ?
5. පූර්ව රාජ්‍ය සමයේදී මෙරට කුඩා ප්‍රදේශයන් පාලනය කරනු ලැබුයේ කවුරුන් විසින්ද?

6.1. ප්‍රාදේශීය පාලන බලයක් පරුමකවරුන්ට අතීතයේදී හිමිව තිබූ බවට සාක්ෂි හමුවන සෙල්ලිපිය කුමක්ද?

2. එහි සඳහන් වන සුවිශේෂි කරුණු ලියා දක්වන්න

7. 'තොටබොජක' යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න

## පුරාණ ග්‍රාමීය සමාජ ව්‍යුහය




### <u>ගෘහපති</u>

- පැරණි සමාජයේ කුඩාම ඒකකය පවුලයි
- 'කුල' යනුවෙන් ද පවුල හඳුන්වනු ලබයි
- පවුලේ ප්‍රධානියා **'ගෘහපති'** නමින් හඳුන්වයි
- සෙල්ලිපි වල මොවුන් හඳුන්වා ඇත්තේ **ගහපති** යනුවෙනි
- සුමනගේ පවුලට අයත් ලෝහ වැඩ සිය රැකියාව ලෙස කළ **ගෘහපතියෙකු** භික්ෂූන් වහන්සේලාට ගල්ගුහාවක් පිරිසිදු කොට පූජා කළ බව **පෙරියන්කුලම** සෙල්ලිපියේ සඳහන් වේ
- ගමක පොදු කටයුතු වලදී එක් එක් පවුල නියෝජනය කිරීමට ගෘහපතීන් ඉදිරිපත් වීම ඔවුන් විසින් ඉටුකළ සුවිශේෂී කාර්යයකි

# <u>ගමික</u>

- පැරණි ගම්වල ජීවත් වූ ගම් ප්‍රධානීන් **ගමික** ලෙස හඳුන්වා ඇත


- සෙල්ලිපිවල මෙන්ම අටුවා ග්‍රන්ථවලද **ග්‍රාමික** හෝ **ගමික** ලෙසද හඳුන්වා ඇත

- පැරණි ගම් එකිනෙකට වෙන් වෙන් වශයෙන් පැවති අතර ගමක් තවත් ගමකින් වෙන්වූයේ **පටු කැලෑ තීරයකිනි**

- මෙම හේතුවෙන් පැරණි සමාජයේ ගම් හඳුන්වා ඇත්තේ විවිධ නාමයන්ගෙනි
  - ✓ **අපේ ගම - තමන් විසූ ගම**
  - ✓ **අල්ලපු ගම - යාබදව පිහිටි ගම**
  - ✓ **පිට ගම - ඈතින් පිහිටි ගම**

- ගෘහපතීන් අතරින් බලවත් සහ ධනවත්ම ගෘහපතියා ගමික ලෙස ගම නියෝජනය කර ඇත

- ගමිකයන් යනු ගෘහපතීන් අතරින්ම පත් වූ කෙනෙකු බව **බුද්ධඝෝෂ හිමියන්** විසින් රචිත **සමන්තපාසාදිකාවේ** සඳහන් වේ



## ගම්කයන් විසින් ඉටු කළ කාර්යයන්

- ගමේ පොදු වැඩ කටයුතු වලදී නායකත්වය ලබා දීම
- ගමට අයත් වැව නඩත්තු කිරීම හා ජලය බෙදා හැරීම
- ගම්වල පැවති ආරවුල් විසඳීම
- ආවාහ - විවාහ කටයුතු වලදී සහාය ලබා දීම
- භාණ්ඩ හුවමාරුව සිදු කරලීම
- දිළිඳු ජනයාට උපකාර කිරීම

  උදා - දිළිඳු වැසියෙකුට ඊලඟ කන්නයේදී ලබාදෙන පොරොන්දුව පිට ගැමිකයෙකු . . විසින් ''වී'' මල්ලක් ණයට ලබාදුන් බව පුවතක් ජාතකට්ඨකතාවේ සඳහන් වීම

- ගම් අතර සාමය හා සහජීවනය පවත්වාගෙන යාම

- ගම්කයන් පිළිබඳව තොරතුරු හමුවන සෙල්ලිපි සාධකයක් වනුයේ **හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිතුල්පව්ව බෞද්ධ විහාරයට** අයත් **කොරවක්ගල ගල් ගුහාවේ** සෙල්ලිපියක සඳහන් වේ
- එම සෙල්ලිපියේ **ගමික සිව, ගමික සුමන, ගමික තිදන** යනාදී ගමිකයන් තිදෙනෙකු විසින් භික්ෂූන් වහන්සේලාට ගල් ගුහාවක් පිරිසිදු කොට පූජා කළ බව සඳහන් වේ.
- ගමිකයන් බිහිවීමට මෙරට දේශපාලන බලය වර්ධනයවීමේ ඉතා වැදගත් තීරණාත්මක අවස්ථාවකි

**ඇගයීම**

**හිස්තැන් පුරවන්න**

1. පැරණි සමාජයක පවුලක ප්‍රධානියා හඳුන්වා ඇත්තේ ............................................... යනුවෙනි
2. පැරණි ගමක් තවත් ගමකින් වෙන්වූයේ ................................................................ නි.
3. ගෘහපතීන් අතරින් ධනවත්ම සහ බලවත්ම පුද්ගලයා .......................................... ලෙස හැඳින්වේ.
4. ගමිකයන් යනු ගෘහපතීන් අතරින්ම පත් වූ කෙනෙකු බව ........................................ සඳහන් වී ඇත.

**පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න**

| | සෙල්ලිපි වල හෝ වෙනත් මූලාශ්‍ර වල හඳුන්වා ඇති නම් | නිදසුන් හමුවන සෙල්ලිපි/වෙනත් මූලාශ්‍ර | ඉටු කළ කාර්යයන් |
|---|---|---|---|
| ගෘහපති | | | |
| ගමික | | | |


## <u>පරුමක</u>

- ගම්කයන් අතුරින් බිහි වූ ප්‍රධානියා **පරුමක** ලෙස හැඳින්වේ

- පුරුෂයන් මෙන්ම ස්ත්‍රීන්ද පැරණි සමාජයේ මෙම තනතුර දරා ඇති අතර ඔවුන් **පරුමුකලූ** ලෙස හැඳින්වේ

- **පරුමකවරුන්ගේ බිහිවීමත් පුරාණ කාලයේ පැවති වැව් නඩත්තු කිරීමත් අතර සබඳතාවක් පැවති බව විද්වතුන්ගේ මතයයි**

- එනම් ගම්වල විසූ ගම්කයින් අතරින් වඩා බලවත් තැනැත්තා එක් වැව් පද්ධතියකට අයත් ගම් සියල්ල නියෝජනය කිරීම සිදුකළ අතර ඔවුන් පරුමකයන් නමින් හඳුන්වා ඇති බවයි.



- ක්‍රි. පූ 900 වන විට මෙරට වියළි කලාපයේ ජනාවාස **කුඩා වැව්** පදනම් කරගෙන ව්‍යාප්ත වූ නමුත් විවිධ හේතු සාධක නිසාවෙන් ක්‍රමයෙන් **වැව් පද්ධති** නිර්මාණය වී ඇත


## වැව් පද්ධති නිර්මාණය වීමෙහි ලා බල පෑ හේතු සාධක

- ✓ වර්ෂාපතනය ප්‍රමාණවත් නොවීම නිසාවෙන් ඇති වූ වියළි කාලගුණික තත්ත්වයන්
- ✓ ජනගහනය වර්ධනයවීමත් සමග ආහාර නිෂ්පාදන අවශ්‍යතාව ඉහළ යාම

- ➢ ඒ අනුව පූර්වෝක්ත ගැටලු සඳහා විසඳුමක් ලෙස තනිව පිහිටි වැවක් වෙනුවට සමීපව ඇති වැව් කිහිපයක් ඇළ මාර්ගවලින් සම්බන්ධකොට වැව් පද්ධතියක් සකස්කරනු ලැබීය
- ➢ මෙවැනි වැව් පද්ධතියක් හැඳින්වීමට **වැව් ප්‍රපතනය** යන නාමය භාවිත කරයි
- ➢ වියළි කලාපයේ වැසියන් මෙය **එල්ලංගාව** ලෙසද හඳුන්වා ඇත

## වැව් ප්‍රපතනයක් නිර්මාණය වීම තුළින් අපේක්ෂිත ප්‍රධාන අරමුණු

1. **භූමියක ඉහළින් පිහිටි වැවක් වැසිදියෙන් පිරුණුවිට ඉන් බැහැරට ගලායන ජලය පහළින් ඇති වැවට හරවා ජලය සංරක්ෂණය කර ගැනීම**
2. **වැව් 2 ක් අතර ඇළ මාර්ගයේ නිරන්තරයෙන් ජලය ගලා යාමට සලස්වා ඇළ දෙපස භූමියේ තෙතමනය ඉහළ නැංවීම සහ තෙතමනය ඉහළ නැංවීමෙන් එම ප්‍රදේශ වල පහසුවෙන් බෝග වගා කළ හැකිවීම**



## පරුමකයින් විසින් ඉටු කළ කාර්යයන්

- වැව් පද්ධතියට අයත් සියලු ගම් නියෝජනය කිරීම
- ජලය බෙදාහැරීම වැව් පද්ධති නිර්මාණය කිරීම සහ නඩත්තු කිරීම
- වැව් පද්ධතිය හා ඊට අයත් ගම්වල විසූ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා ක්‍රියා කිරීම

ප්‍රාදේශීය පාලනය ගෙන ගිය පරුමකයින්ගේ බලය වර්ධනය වූ අයුරු දෙස බලන විට ඇතැම් අවස්ථාවල ඔවුන් **'රජ'** ලෙස හඳුන්වා ඇත

පොචනි රජ (ප්‍රාචීනරජ / නැගෙනහිර ප්‍රදේශයේ රජ) → මාතලේ ඇඹුල්අඹේ ප්‍රදේශයේ සෙල්ලිපිය

දුහතර රජ → කෑගල්ල යටහලෙන බෞද්ධ විහාරයට අයත් ගල්ගුහා සෙල්ලිපිය

- 'රජ ' යන පදයෙන් සතුටු කරන්නා යන්න අර්ථගැන්වෙන අතර ජනතාවගේ සුභ සිද්ධිය පිළිබද අනලස්ව ක්‍රියාකොට ජනතාව සතුටට පත්කරන්නා යන්න හැඳින්වීමට රජ යන පදය පරුමකරුවන් හට යොද ඇත
- ශ්‍රී ලංකාවේ දේශපාලන බලයේ විකාශනය බෙදී ගිය ක්‍රමයක් ලෙස ආරම්භ වූ බව හඳුනාගත හැකිය
- මෙම ක්‍රමය හැඳින්වීමට වඩාත් සුදුසු ව්‍යවහාරය වන්නේ **විමධ්‍යගත පාලනය** යන්නයි




**ඇගයීම**

**පහත සඳහන් සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

1. වැව් ප්‍රපතනයක් හෙවත් එල්ලංගාව යනුවෙන් හැඳින්වූයේ කුමක්ද ?
2. වැව් ප්‍රපතනයක් නිර්මාණයවීමෙහි ලා බලපෑ හේතු 2ක් ලියන්න
3. වැව් ප්‍රපතනයක් ගොඩනැංවීම තුළින් අපේක්ෂිත ප්‍රධාන අරමුණු දෙක කුමක්ද?
4. I. පරුමක යනුවෙන් හැඳින්වූයේ කවුරුන්ද ?
   II. පරුමකලු යනුවෙන් හැඳින්වූයේ කවුරුන්ද ?
   III. පරුමකයින්ගේ බිහිවීමත් පුරාණ කාලයේ වැව් නඩත්තු කිරීමත් අතර ඇති සබඳතාවය කුමක්දැයි පැහැදිලි කරන්න
5. පරුමකයින් විසින් ඉටුකළ සුවිශේෂී කාර්යයන් 3ක් නම් කරන්න
6. රාජ්‍යත්වයේ මූලාරම්භය ලෙස සැලකෙන පරුමකවරුන් හැඳින්වීමට භාවිත කළ නම් 2ක් ලියන්න
7. 'රජ' යන පදයෙන් අදහස් කරන්නේ කුමක්ද ?


## රාජ්‍යත්වයේ වර්ධනය

- රාජ්‍යත්වයේ වර්ධනය යනු **විකේන්ද්‍රගතව තිබූ බලය මධ්‍යගත වීමයි**

- බලය මධ්‍යගතවීම යන්නෙන් අදහස් වනුයේ බලය **එක් පුද්ගලයෙකුගේ අණසක යටතට පත්වීමයි**

- බලය මධ්‍යගතවීමෙන් **'රාජ්‍යය'** යන යාන්ත්‍රණය නිර්මාණයවේ

- රාජ්‍යයේ ප්‍රධානියා රජු වන අතර ඔහුගේ පාලනයට යටත් වූ නිශ්චිත භූමි ප්‍රදේශයක් සකස්වේ




- පරුමකවරුන්ගේ නායකයා, **මහා පරුමක හෙවත් රජ** නමින් හඳුන්වනු ලැබීය

**ශ්‍රී ලංකාවේ මධ්‍යගත පාලනයේ ආරම්භක රජවරු**

- පණ්ඩුකාභය රජු
- දේවානම්පියතිස්ස රජු
- දුටුගැමුණු රජු
- භාතිකාභය රජු
- වසභ රජු


## <u>පණ්ඩුකාභය රජු</u>

- පරුමකවරුන් වූ සිය මාමාවරුන් සමග සටනකර රාජ්‍යත්වය ලබාගනී
- අනුරාධපුරය සිය පාලන මධ්‍යස්ථානය ලෙස තෝරාගෙන අනුරාධපුර නගරය ගොඩනැගීම සිදු කරයි
- සිය දසවෙනි රාජ වර්ෂයේදී ග්‍රාම සීමා ලකුණු කිරීම
- වාරි මාර්ග ඉදිකිරීම මගින් කෘෂිකාර්මික කටයුතු නගා සිටුවීම
- විවිධ ආගමික කණ්ඩායම්වලට අනුග්‍රහය දැක්වීම

## <u>දේවානම්පියතිස්ස රජු</u>

- ජාත්‍යන්තර වෙළදාමේ කේන්ද්‍රීය ස්ථානයක් බවට මෙකල ලංකාව පත් වූ නිසාවෙන් දේශපාලන බලය මධ්‍යගතවීමේ අවශ්‍යතාව වර්ධනය විය
- ඉහත කාර්යයන් සඳහා මොහු විසින් ප්‍රාදේශීය පාලකයින් සමග සුහදත්වය ගොඩනගා ගැනීම

**උදා - ශ්‍රී මහා බෝධිය රෝපණය කිරීමේ අවස්ථාවට කතරගම හා චන්දන ග්‍රාමයෙහි ක්ෂත්‍රියන්ට ආරාධනා කිරීම**






➢ ඉන්දියාවේ අශෝක අධිරාජ්‍යයා සමග සබඳතා පැවැත්වීම

**උදා - අභිෂේක ක්‍රමය ලැබීම, "දෙවනපිය" යන අභිධානය ලැබීම**

➢ වැව් ඉදිකිරීම මගින් කෘෂිකර්මාන්තය නගා සිටුවීම

**උදා - තිසා වැව**

➢ ජාත්‍යන්තර වෙළඳ කටයුතු සඳහා රට සූදානම් කිරීම

➢ මහින්දාගමනයත් සමඟ බුදු දහම මෙරටට වැඩම කිරීම

➢ **ථූපාරාමය, ඉසුරුමුණිය, මහා විහාරය** ආදී වෙහෙර විහාර ඉදිකිරීම ආදිය මගින් බුදු සසුන නගා සිටුවීමෙහිලා මහඟු සේවයක් ඉටු කිරීම



## දුටුගැමුණු රජු

- **ප්‍රථම වරට දිවයින එක්සේසත් කළ ප්‍රථම පාලකයා විය**

- කාවන්තිස්ස රජුගේ සහ විහාරමහාදේවියගේ පුත්‍රයෙකි

- එළාර රජුට විරුද්ධව සිදු කළ යුධ ව්‍යාපාරය ලංකා ඉතිහාසයේ ප්‍රථම සංවිධානාත්මක යුධ ව්‍යාපාරයයි

- එම සටන් ව්‍යාපාරය සඳහා පරුමුකවරුන්ගේ සහාය ලබාගෙන ඇත

  **උදා - දස මහා යෝධයන් - සිතල්පව්ව සෙල්ලිපිය**




- බලය මධ්‍යගත කළ පසු පරුමුකවරුන් රජයේ විවිධ තනතුරුවලට පත් කරන ලදි

  **උදා - සේනාපති පරුමක වුස්සදේව**

  **සේනාපති පරුමුක වේළුසුමන**

- පැරණි ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත කිරීමේ ක්‍රියාවලියේ ප්‍රධාන නියමුවෙකු ලෙස හඳුන්වාදිය හැකිය

## භාතිකාභය රජු

- මෙම රාජ්‍ය පාලන අවධියේදී ශ්‍රී ලාංකීය තනාපතියෙකු **රෝමයට** ගොස් වීදුරු පබලු රැගෙන ආ බව මූලාශ්‍රවල සඳහන්වේ





## වසභ රජු

- සමස්ත ශ්‍රී ලංකාවම එක් ඒකකයක් ලෙස මෙකල ක්‍රියාත්මකවිය

- රටේ අභ්‍යන්තර පාලනය විධිමත්ව සංවිධානය කිරීම

- පරිපාලන දිස්ත්‍රික්ක වෙන්කොට එක් එක් දිස්ත්‍රික්ක පාලනයට ඇමතිවරු පත් කිරීම
  **උදා - වල්ලිපුරම් රන් සන්නස - සෑෂිගිරි නම් ඇමතියා යාපනය ප්‍රදේශයේ පාලනය කළ බව සඳහන් වේ**



**ඇගයීම**

1. රාජ්‍යත්වයේ වර්ධනය යනු කුමක්දැයි ලියන්න
2. දේශපාලන බලය මධ්‍යගත කිරීමේදී ලංකාවේ රාජ්‍ය පාලකයින් විසින් පරුමකවරුන්ගේ සහය ලබාගත් බවට දැක්වෙන නිදසුන් දෙකක් ලියන්න
3. බලය විමධ්‍යගතව පැවති යුගය හා රාජ්‍යත්වය වර්ධනය වූ යුගය අතර ඇති වෙනස කරුණු දෙකක් මගින් කෙටියෙන් පැහැදිලි කරන්න.

## රාජ්‍යත්ව සංකල්පය

- දේශපාලන බලය මධ්‍යගතවීමත් සමග රජු ඉතා බලසම්පන්න අයෙකු විය.

- රාජ්‍ය පාලකයින් විසින් ඉටු කලයුතු සුවිශේෂී කාර්යයන්
  - **රට ආර්ථික වශයෙන් දියුණු කිරීම**
  - **රට වැසියාට ආරක්ෂාව සැපයීම**
  - **රට වැසියාගේ ආධ්‍යාත්මික සංවර්ධනය ගොඩ නැංවීම**
  - **විදේශ සබඳතා ගොඩනංවා ගැනීම**

- රජවරුන්ගේ ක්‍රියා කලාපය හා පෙනීසිටීමට උත්සාහ කල ස්වරූපය අනුව රාජ්‍යත්වය පිලිබඳ විවිධ සංකල්ප ගොඩනැගී ඇත

**දේවත්ව**
**බෝධිසත්ව**
**පර්වතරාජ**
**චක්‍රවර්තී**

## දේවත්ව සංකල්පය

- රාජ්‍ය පාලනයේදී රජු දෙවියෙකු මෙන් පෙනී සිටීම

  **නිදසුන් :**

  - **කූටකණ්ණ අභය රජු → නරේශ්වර → දඹුලු විහාර පර්වත ලිපිය**
  - **මහසෙන් රජු → මින්නේරි දෙවියන්**

## බෝධිසත්ව සංකල්පය

- රජු බෝධිසත්වයෙකු ලෙස පෙනී සිටිමින් ජනතාවගේ හිතසුව පිණිස යුක්ති ගරුක දැහැමි පාලනයක් ගෙනයාම

  **නිදසුන් :** සිරිසඟ බෝ රජු බෝධිසත්වයෙකු ලෙස සැලකීම

## පර්වතරාජ සංකල්පය

- පර්වතරාජ යන සංකල්පයෙන් පෙනී සිටිම පැරණි කාලයේ ආසියාවේ පාලකයන් අනුගමනය කල පිළිවෙතකි.

  නිදසුන් :

  පලමුවන කාශ්‍යප රජු → අලකපය මහ රජ (ආලකමන්දාධිපති මහ රජු)

  **අලකමන්දාව යනු පර්වතයක් බව සාහිත්‍යමූලාශ්‍රවල සඳහන් වේ**

## චක්‍රවර්ති සංකල්පය

- **චක්‍රවර්ති යනු සමස්ත ලෝකයටම අධිපති යන තේරුම ලබා දෙන සංකල්පයකි.**

  **නිදසුන් :**

  නිශ්ශංකමල්ල රජු → කාලිංග චක්‍රවර්තී ස්වාමීන්වහන්සේ

**ඇගයීම**

1. පුරාණ ලංකාවේ පාලකයා විසින් රටවැසියාට ඉටුවිය යුතු යුතුකම් ලෙස සැලකූ කරුණු 03 ක් ලියන්න

2. රාජ්‍යත්ව සංකල්ප නම්කොට එක් එක් රාජ්‍යත්ව සංකල්ප සඳහා නිදසුන් වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න.

## රාජ්‍ය උරුමය

### පැරණි ලක්දිව රාජ්‍ය උරුමය

**සහෝදරයාගෙන් සහෝදරයාට උරුමය ලැබීම**

නිදසුන

- දුටුගැමුණු රජුගෙන් පසු ඔහුගේ සොයුරු වූ සද්ධාතිස්ස රජ වීම

**පියාගෙන් පුතාට උරුමය ලැබීම**

නිදසුන

- කාවන්තිස්ස රජුගෙන් පසු දුටුගැමුණු රජ වීම
- වසභ රජුගෙන් පසු වංකනාසිකතිස්ස රජ වීම

❖ පියාගෙන් පුතාට රජකම උරුමවූයේ රජුගේ වැඩිමහල් පුත්‍රයාට නැතහොත් අගබිසවගේ වැඩිමහල් පුත්‍රයාටය

❖ එසේනොවූ අවස්ථාවල ගැටුම් ඇති වූ බවට ඉතිහාසයේ සාක්ෂි හමුවී ඇත

**නිදසුන්**

- **ධාතුසේන රජුගෙන් පසු කාශ්‍යප කුමරු හා මුගලන් කුමරු අතර රජ උරුමය සඳහා වූ ගැටුම**

❖ ඉහත ක්‍රම දෙකටම නිසි රාජ්‍ය උරුමක්කාරයකු නොවූ අවස්ථාවල රජකම හිමිවීම රජුගේ බිසවගේ සොහොයුරාට හා රජුගේ සොහොයුරියගේ පුතාට ලැබුණු අවස්ථාද ලංකා ඉතිහාසයේ දක්නට ලැබේ


**නිදසුන්**

- **ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගෙන් පසු බිසවගේ සෙහොයුරු ශ්‍රී විජය රාජසිංහ කුමරු රජවීම**

# රාජ්‍ය තන්ත්‍රය

- ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගතවීමෙන් පසු ක්‍රමානුකූල රාජ්‍ය පරිපාලන සැකැස්මක් ගොඩනැංවිණි

- පැරණි සෙල්ලිපි ඇසුරෙන් එම පරිපාලන තන්ත්‍රයට අයත් නිලධාරි තන්ත්‍රයේ ව්‍යුහය පහත සඳහන් අයුරින් හඳුනාගත හැකිය



- පූර්වෝක්ත නිලධාරි තන්ත්‍රය මගින් ලංකාවේ රාජ්‍ය පරිපාලන කටයුතු පවත්වාගෙන යෑම සඳහා මහගු පිටුවහලක් වූ අතර මෙයින් වඩාත් ප්‍රයෝජන ලැබුණේ රටේ පොදු මහජනතාවටයි







**ඇගයීම**

1. පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය ක්‍රියාත්මක වූ ක්‍රම නිදසුන් සහිතව ලියන්න

2. පැරණි සෙල්ලිපිවලට අනුව දේශපාලන බලය මධ්‍යගතවීමෙන් පසු ලංකාවේ ගොඩනැගුණු රාජ්‍ය පරිපාලන සැකැස්මට අදාළ නිලධාරී තන්ත්‍රය ලියා දක්වන්න (පැරණි නාමයන්ද සහිතව)

### 3.3 මෙරට පාලනය කළ ශ්‍රේෂ්ඨ රජවරු

**වසභ රජු**

**දේශපාලන කාර්යයන්**

- ලම්භකර්ණ රාජවංශයේ ආරම්භක පාලකයා විය.
- රටේ අභ්‍යන්තර පාලනය විධිමත්ව සංවිධානය කිරීම
- පරිපාලන දිස්ත්‍රික්ක පාලනයට ඇමතිවරු පත් කිරීම

  **උදා - වල්ලිපුරම් රන් සන්නස** ( සෘෂිගිරි නම් ඇමතිවරයා යාපනය ප්‍රදේශය පාලනය කළ බව සඳහන් වේ.)

**ආර්ථික කාර්යයන්**

- බදු අයකිරීම ක්‍රමවත්ව සිදු කිරීම
- ප්‍රථමවරට මහා පරිමාණ වැව් ඉදි කරමින් කෘෂිකර්මය නගා සිටුවීම

**ආගමික කාර්යයන්**

- භික්ෂූන්ට සිව්පසයෙන් අනුග්‍රහ කිරීම
- වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම



## දුටුගැමුණු රජු

### දේශපාලන කාර්යයන්

- දිවයිනම එක්සේසත් කළ ප්‍රථම පාලකයා විය.
- එළාර රජුට විරුද්ධව කළ යුධ ව්‍යාපාරය ඉතිහාසයේ ප්‍රථම සංවිධානාත්මක යුධ ව්‍යාපාරයයි.
- යුධ ව්‍යාපාරයේදී පරුමකවරුන්ගේ සහය ලබා ගැනීම
  උදා - දසමහා යෝධයන් (සිතුල්පවුව ගල්ගුහා සෙල්ලිපිය)
- බලය මධ්‍යගත කළ පසු පරුමකවරුන් රජයේ විවිධ තනතුරුවලට පත් කිරීම
  උදා - සේනාපති පරුමක වුස්සදේව, සේනාපති පරුමක වේළුසුමන


### ආර්ථික කාර්යයන්


- ජාත්‍යන්තර වෙළඳ අවශ්‍යතාවය මත මහාතිත්ථ වරාය දියුණු කිරීම

### ආගමික කාර්යයන්

- බුදු දහමේ චිරපැවැත්ම සඳහා මහඟු සේවයක් කිරීම
  උදා - රුවන්වැලිසෑය, මිරිසවැටිය වැනි වෙහෙර විහාර ඉදි කිරීම











ඇගයීම

පහත සඳහන් රාජ්‍ය පාලකයින්ගේ දේශපාලන, ආර්ථික සහ ආගමික කාර්යයන් ඇතුලත් කරමින් කෙටි සටහන් පොතක් නිර්මාණය කරන්න

1. දුටුගැමුණු රජු
2. වසභ රජු
3. විජයබාහු රජු